# 5 තොරතුරු අසා දැන ගනිමු

ආයුබෝවන් ගුරුතුමී !

ආයුබෝවන් දරුවනේ !

හොඳයි, ඔය දරුවන්ට මම කිව්වා නේද ගුවන්විදුලියෙන් හරි රූපවාහිනියෙන් හරි ප්‍රවෘත්ති කීපයක් අහලා ලියාගෙන එන්න කියලා.

බලන්න, ලියාගෙන ආපු අය. හොඳයි, හොඳයි, ඔක්කොම ළමයි ලියාගෙන ඇවිත් තියෙනවා.

අපි දැන් අහමු. නවෝද ලියාගෙන ආපු ප්‍රවෘත්ති. ඔක්කොම නිහඬ ව සවන් දෙන්න ඕනෑ.



"හින්දු දහම් පාසල් විභාගය මේ මස විසිදෙක හා විසිතුන යන දිනවල පැවැත්වේ. එය මධ්‍යස්ථාන විසි පහක දී පැවැත්වෙන බව සංස්කෘතික අමාත්‍යාංශය නිවේදනය කළේ ය. මේ සඳහා අපේක්ෂකයෝ දෙදහස් තුන්සීයයක් පෙනී සිටිති."

"ශ්‍රී ලංකාවේ දුෂ්කර ප්‍රදේශවල පවතින විදුලිබල හිඟය මැඩ පැවැත්වීමට ගැමි විදුලි යෝජනා ක්‍රම දෙසිය පනහක් ආරම්භ කෙරේ. මේ සඳහා සියලු කටයුතු යොදා ඇති බව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පවසයි. ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය ද මේ සඳහා සහාය ලබා දේ."

"දෙහිවල සත්ත්වෝද්‍යානය තව දුරටත් සංවර්ධනය කිරීමට එම දෙපාර්තමේන්තුව තීරණය කරයි. දැනට මෙහි නැති සතුන් කීප දෙනකු අලුතින් ගෙන්වීමට ද තීරණය කර ඇත. "හිම වලසා, පැන්ඩා සහ අප්‍රිකානු සිංහයා ඒ අතර වෙති. පුංචි දරුවන් උදෙසා විනෝදාත්මක වැඩසටහන් මාලාවක් ආරම්භ කිරීමට ද සත්ත්වෝද්‍යාන පාලන අධිකාරිය කටයුතු කරගෙන යයි."

බොහොම හොඳයි නවෝද, ඔය දරුවො හොඳට සවන් දුන්නා නේ ද ප්‍රවෘත්තිවලට?

ඔව්, ගුරුතුමී.

බොහොම හොඳයි.

## ක්‍රියාකාරකම : 1

ඔබ සවන් දුන් ප්‍රවෘත්ති ඇසුරෙන් පහත අසන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා කියන්න.

(1) හින්දු දහම් පාසල් විභාගය පැවැත්වෙන්නේ කවර දිනවල ද?

i. විසිපස්වන දින
ii. විසිදෙක හා විසිතුන දිනවල
iii. විසිදෙවන දින

(2) එම විභාගයට අපේක්ෂකයෝ කී දෙනෙක් සහභාගි වෙත් ද?

i. විසිපහක්
ii. දෙදහසක්
iii. දෙදහස් තුන්සීයක්

(3) ගැමි විදුලි යෝජනා ක්‍රම ආරම්භ කරන්නේ කවුද?

i. ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
ii. විදුලිබල අමාත්‍යාංශය
iii. විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

(4) සත්ත්වෝද්‍යානයට අලුතින් ගෙන ඒමට තීරණය කළ සතුන් නම් කරන්න.

i. හිම වලසා
ii. අප්‍රිකානු සිංහයා හා පැන්ඩා

iii. මේ සියලුදෙනා ම

(5) සත්ත්වෝද්‍යානය පුංචි දරුවන් සඳහා අලුතින් ආරම්භ කරන්නේ මොනවා ද?

i. ක්‍රීඩා තරග

ii. විනෝදාත්මක වැඩ සටහන්

iii. සතුන් නැරඹීම

## ක්‍රියාකාරකම : 2

පාඩමේ ඔබ සවන් දුන් ප්‍රවෘත්ති අතරින් වඩාත් ම ඔබේ සිත් ගත් ප්‍රවෘත්තිය තෝරා, අනෙක් සිසුන්ට සවන් දීම සඳහා පන්තිය ඉදිරියේ කියන්න.

## ක්‍රියාකාරකම : 3

ප්‍රවෘත්තිවලට සවන් දීමේ දී රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක් ගැන කියැවිණි. ඒවා මොනවා ද?

## ක්‍රියාකාරකම : 4

මෙම ප්‍රවෘත්තිවලට අමතර ව රූපවාහිනියෙන් හෝ ගුවන්විදුලියෙන් හෝ සවන් දුන් ප්‍රවෘත්ති අතරින් ඔබ සිත්ගත් යමක් පන්තියට ප්‍රකාශ කරන්න.

## ක්‍රියාකාරකම : 5

පහත සඳහන් ප්‍රකාශය ගුරුතුමා/ගුරුතුමිය කියවන විට හොඳින් සවන් දෙන්න. ඉන්පසු අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

බෝපිටිය මාහොලොව ගමේ ඉපදුණු දෙළොස් හැවිරිදි කසුන් අත්තනායක සංගීතයට දක්ෂ පිරිමි ළමයෙක්. එයා ඉගෙන ගන්නෙ පන්නල මහා විද්‍යාලයේ, හත්වන ශ්‍රේණියේ. ඔහුගේ පියා අනුර අත්තනායක. එයා පරිගණක වැඩසටහන් සකසන්නෙක්. මව වන සමන්තිකා රැකියාවක් නොකරයි.

(i) මෙහි සඳහන් දරුවාගේ නම කුමක් ද?
(ii) ඔහුගේ ලිපිනය කියන්න.
(iii) ඔහුගේ වයස කීය ද?
(iv) ඔහු ඉගෙනුම ලබන පාසලේ නම කුමක් ද?
(v) ඉගෙනුම ලබන ශ්‍රේණිය කුමක් ද?
(vi) ඔහු සතු දක්ෂතාව කුමක් ද?
(vii) ඔහුගේ පියාගේ නම කියන්න.
(viii) පියාගේ රැකියාව කුමක් ද?
(ix) කසුන්ගේ මවගේ නම කුමක් ද?
(x) මව රැකියාවක් කරන්නී ද?

## ක්‍රියාකාරකම : 6

පහත දක්වෙන ප්‍රවෘත්ති එක් අයකු කියවන විට අනෙක් අය සවන් දී එහි ඇති ප්‍රධාන අදහස වටහාගෙන කියන්න.

- පසුගියදා පැවති වයඹ පළාත් පාසල් ක්‍රීඩා තරගයේ දී අවුරුදු පහළොවෙන් පහළ බාලිකා මීටර් සියය දිවීමේ තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීමට ලයනි පවිත්‍රා ක්‍රීඩිකාව සමත් වූවා ය. මීටර් දෙසීය දිවීමේ තරගයෙන් ද ප්‍රථම ස්ථානය දිනාගත් ඈ දක්ෂතම ක්‍රීඩිකාවට හිමි සම්මානය ද දිනා ගත්තා ය.

- මේ දිනවල ශීඝ්‍රයෙන් පැතිරී යන ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළක් දියත් කරන බව බස්නාහිර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා පැවසී ය. විශේෂයෙන් පාසල් අවට පවිත්‍ර ව තබා ගැනීමට ශිෂ්‍ය සහභාගිත්වය ලබා ගැනීමට බලාපොරොත්තු වන බව එතුමා පැවසී ය.